## මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ

## ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීම 2026/2027

## කොන්ත්‍රාත් අංකය: MOF/NCB/13/13/2026

කොළඹ 01, ලෝටස් පාර පිහිටි මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ආපනශාලාව 2026/2027 වර්ෂය සඳහා පවත්වාගෙන යාමට සුදුසුකම්ලත් ආයතන වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන ලංසුකරුවන්ට 2026.03.12 දින සිට 2026.03.31 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් නමින් ගණකාධිකාරී (ගෙවීම්) වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර **ආපසු නොගෙවන රු.1000.00** ක ගාස්තුවක් අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවීමෙන් පසු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ලේ ඉහළ බිම් මහලේ පිහිටි ගිණුම් අංශයෙන් ලංසු ලේඛන ලබාගත හැක. එමෙන්ම ලංසු ලේඛන පරීක්ෂා කර බැලීමට අවශ්‍ය වන්නේ නම්, ඉහත වේලාවන් හා දිනයන්හි දී මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ගිණුම් අංශයේදී එය පරීක්ෂා කර බැලිය හැකිය.

03. ලංසුකරුවන් සඳහා සුදුසුකම්

I. ආසන්න වසර 05 තුල අවම වශයෙන් වසර 03 ක කාලයක්, රජයේ හෝ රජයට අනුබද්ධිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ආපනශාලාවක් පවත්වාගෙන ගොස් තිබිය යුතු අතර පළපුරුද්ද සනාථ කිරීම සඳහා ලේඛන ඉදිරිපත් කළ යුතුය.

II. ආහාර සැපයීම/භෝජනාගාර පවත්වා ගෙනයාම සම්බන්ධයෙන් ව්‍යාපාර පවත්වා ගෙනයාම පිළිබඳව නිකුත් කරන ලද ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

III. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සහතික කරන ලද වෙළඳ බලපත්‍රයෙහි සහතික කරන ලද පිටපතක් ලංසු ලියවිලි සමඟ ඉදිරිපත් කළ යුතුය.

IV. ආහාර පිළියෙල කරන්නන්ගේ හා ආහාර පිළිගැන්වීම කරන්නන්ගේ නිපුණතාවය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

V. රජයේ හෝ රජයට අනුබද්ධිත ආයතන හෝ පෞද්ගලික ආයතන මඟින් අසාධු ලේඛනගත වූ සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් සමග කොන්ත්‍රාත් ගිවිසුම් ඇති කර ගනු නොලබන අතර ලංසුකරු එසේ අසාධු ලේඛනගත නොවූ ආයතනයක් බවට ලිඛිත ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

VI. සියලුම ලංසුකරුවන් ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නමින් 2026.07.02 දින දක්වා වලංගු ලංසු සුරක්ෂණ ප්‍රකාශනයක් **(Bid Security Declaration)** ඉදිරිපත් කළ යුතුය.

04. මුද්‍රා තබන ලද ලංසු "මුල් පිටපත" හා "අනු පිටපත" වශයෙන් පිටපත් දෙකකින් යුතුව වෙන වෙනම මුද්‍ර තබා එම පිටපත් දෙකම එක් කවරයක බහා 2026.04.02 වන දින ප.ව. 02.00 ට පෙර ප්‍රධාන ගණකාධිකාරී, ගිණුම් අංශය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, නව ගොඩනැගිල්ල, ඉහල බිම් මහල, ලෝටස් පාර, කොළඹ 01. ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ඉහල බිම් මහලේ පිහිටි ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හෝ කටයුතු කළ යුතුය. මිල ගණන් ඉදිරිපත් කරන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා මිල ගණන් කැඳවීම - 2026/2027"** යනුවෙන් අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය.

05. ලංසු විවෘත කිරීම **2026.04.02** දින **ප.ව. 02.00** ට සිදු කරන ඒ සඳහා ඔබට හෝ ඔබගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැක. ලංසු භාරගැනීමේ වේලාව අවසන් වූ පසු එනම් **2026.04.02** දින **ප.ව. 02.00** න් පසුව ඉදිරිපත් කරනු ලබන ලංසු ප්‍රතික්ෂේප කරනු ලබන අතර එම ලංසු විවෘත කිරීම සඳහා භාරගනු නොලැබේ.

06. පූර්ව ලංසු රැස්වීම **2026.03.23** දින **පෙ.ව 10.00** ට මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ගිණුම් අංශයේදී පැවැත්වීමට කටයුතු සූදානම් කරන අතර එම රැස්වීමෙන් පසුව ආපනශාලා පරිශ්‍රය නිරීක්ෂණය කළ හැකිය.

07. ආපනශාලාව සඳහා අවශ්‍ය මේස, පුටු, විදුලිය, ජලය හා අනෙකුත් උපකරණ යනාදී පහසුකම් ද මෙම අමාත්‍යාංශය විසින් සපයනු ලැබේ.

වැඩි විස්තර ප්‍රධාන ගණකාධිකාරී, දුරකථන අංක 011 2484535 විමසා ලබා ගත හැක.

සභාපති - අමාත්‍යාංශ සුළු පරිමාණ ප්‍රසම්පාදන කමිටුව,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01.
දු.ක අංක: 011 2484539 / 011 2484600